# සත්තුන්ට ආදරය කරමු



රිෂිනි රදීමහලියද්ද

# සත්තුන්ට ආදරය කරමු

රුෂිනි රුදීමහලියද්ද

සත්තුන්ට ආදරය කරමු

© රිෂිනි රිදීමහලියද්ද
මහාමායා බාලිකා විදුහල
4 ශ්‍රේණිය D
2025.02.08

ISBN 978 - 624 - 208 - 285 - 1

පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය  මහනුවර.

අද හරිම ලස්සන දවසක් පාසල් නිවාඩු වුණාත් මම වෙනදා පුරුද්දට උදෙන්ම අවදි වුණා. පරිසරය හරිම සුන්දරයි. කුරුල්ලොන්ගේ කීචි බීචි හඬ ඇහෙනවා. ඉරත් හොඳට පායලා.



අත්තම්මාත් උදෙන්ම නැගිටලා සමන්පිච්ච මල් ගහේ මල් කඩනවා. මමත් අත්තම්මට මල් කඩන්න උදව් කරා. අත්තම්මා කිව්වා ඔක්කොම මල් කඩන්න එපා සමනලුන්ටයි, මීමැස්සන්ටයි මල් ටිකක් ඉතිරි කරන්න කියලා.



අල්ලපු ගෙදර මාමාග් අඹ ගහේ ගෙඩි ගොඩක් පිරිලා. අද ඒ අඹ ගෙඩි ඔක්කොම කඩලා. අපිට මාමා අඹ ගෙනත් දුන්නා. මාමා කිව්වා සත්තුන්ට අඹ ගෙඩි ටිකක් ඉතිරි කරා කියලා.



මම සත්තුන්ට හරිම ආදරෙයි. මම තාත්තාට කිවුවා මට ගිරවෙක් ගෙනල්ලා දෙන්න කියලා. නමුත් තාත්තා කිව්වා සත්තු කූඩු කරලා තියන්න හොද නෑ එයාලා පව් කියලා. අපි සතුන්ට නිදහසේ ජීවත් වෙන්න ඉඩ දෙමු.



මට අපූරු අදහසක් ආවා. මම තාත්තාට කිව්වා අපි කුරුලු ලෑල්ලක් හදමු කියලා. තාත්තා මට කුරුලු ලෑල්ලක් හදලා දුන්නා. මට හරිම සතුටුයි.




මම හැමදාම උදේට කුරුලු ලෑල්ලට කෑම තිබ්බා වතුර තිබ්බා. මයිනෝ, ලේන්නු, දෙමලිච්චෝ, රිලවු කෑම කන්න එනවා බලාගෙන ඉන්න හරිම ලස්සනයි.



මම අපේ ගුරුතුමියටත් මගේ කුරුලු ලෑල්ල ගැන කිව්වා. ගුරුතුමී ගොඩක් සතුටු වුණා. එයා අනිත් ළමයින්ට කුරුලු ලෑල්ල හදන්න උපදෙස් දුන්නා. යාළුවෝ හැමොම කුරුලු ලෑල්ල හදන විදිහ මගෙන් අහගත්තා මට හරිම සතුටුයි.



අපි හැමදාම කුරුලු ලෑල්ලට තියන වතුර එක අයින් කරලා අලුත් වතුර එකක් තියන්න ඕනි. නැතිනම් මදුරුවෝ බෝවෙලා අපිට ලෙඩ හැදෙනවා. ගුරුතුමී කීවා. මම හැමදාම අලුතින් වතුර එකක් තියන්න පුරුදු වුණා.



අපි වගේම සත්තුන් පරිසරයේ කොටසක්. අපි සතුන්ව රැකබලා ගන්න ඕනි. කරුණාව දක්වන්න ඕනි. එයාලාට ජිවත් වෙන්න පරිසරය ආරක්ෂා කරලා දෙන්න ඕනි.

අපි සත්තුන්ට අදරය කරමු...



කිචි බිචි කියමින් පියඹනවා
පැණි බී සමනලුන් ඉගිලනවා
ලේන්නු ටිං ටිං හඬ නගනවා
පරිසරය සුන්දර වෙනවා

ආදරය කරුණාව දක්වමු
ආදරයෙන් රැක බලා ගමු
සත්තුයි අපියි යාලුවෝ වෙමු
හැමෝම ආදරයෙන් ඉමු



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්